ඝාතන සිදුවීමක් හා සම්බන් දිවි තොර කරගැනීමකට සැමවිටම සාමාන්‍ය දිවි තොරකරගැනීමේ සිදුවීමකට වඩා ඉහළ අවධානයක් ලබෙනා බැවින්, එවැනි සිදුවීම් වාර්තාකරණයේදී වැඩිමනත් ප්‍රවේසම් වීමක් අවශ්‍ය වේ. එහිදීද යෝග්‍ය භාවිතාව විය යුත්තේ දිවි තොර කරගැනීම් වාර්තා කිරීම සම්බන්ධයෙන් හඳුන්වා දී ඇති මාධ්‍ය ආචාර ධර්මයන් පිළිපැදීමයි.

උදාහරණයක් ලෙසට ඝාතන-දිවි තොර කරගැනීම් සිදුවීමක් මුද්‍රිත මාධ්‍ය තුළ (ජනවාරි 17, 2022 දින මව්බිම,අරුණ, දිවයින, දිනමිණ) වාර්තා කර ඇති ආකාරය පෙන්වා දිය හැක.

1) මෙහි දිවි තොර කරගත් ආකාරය දක්වා ඇත. ඒ ඔස්සේ දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකුට ඊට උත්ප්‍රේරණයක් ලැබීමේ හැකියාවක් ඇති අතර, ඒ ඔස්සේ අනුකාරක දිවි තොර කරගැනීම්ද සිදුවීමේ ඉඩක් පවතී.

2) හදිසි උපකාරක අංක පළකර නැත. මෙම පුවත් වාර්තාවන් හා හදිසි උපකාර අංක පළ කළේ නම්, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවකින් යුතු අයෙකුගේ ජීවිතය බේරාගැනීමට එයින් ඉඩක් ලැබෙනු ඇත.

දිවි තොර කරගැනීම් වාර්තාකරණයේදී මාධ්‍ය ආචාර ධර්මයන් පිළිපැදීම, විශේෂයෙන්ම සැලකිල්ලට ගත යුතු මාධ්‍ය වගකීමක්ද නොවන්නේද ?

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
https://media.samaritans.org/.../Guidance_for_reporting... https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...